1527

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - 2023
**STP8306/ ESP2106-** අධ්‍යාපනයේ මාර්ගෝපදේශනය හා උපදේශනය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.11.19 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද II වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. මාර්ගෝපදේශනය සහ උපදේශනය අතර වෙනස පැහැදිලි කරන්න.

02. අධ්‍යාපන උපදේශනයේ දී වැදගත්වන සච්චාරිත්‍ර ධර්ම (Codes of ethics) හතරක් (04) සඳහන් කරන්න.

03. ඔබ පාසලේ පාසල් මාර්ගෝපදේශන සහ උපදේශන සේවාව සඳහා අන්තර්ගත කළයුතු ලක්ෂණ දෙකක් (02) කෙටියෙන් සාකච්ඡා කරන්න.

04. වෘත්තීය උපදේශන සේවාවක මූලික අංග හතරක් (04) සඳහන් කරන්න.

05. මාර්ගෝපදේශනය සහ උපදේශනය පිළිබඳ දැනුම ගුරුවරුන් හට ඔවුන්ගේ ගුරු වෘත්තීය තුළ සාර්ථක වීමට සහය වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට හේතු තුනක් (03) සාකච්ඡා කරන්න.

06. "කලහකාරී හැසිරීම" සහ "සමාජ විරෝධී හැසිරීම" අතර වෙනස සුදුසු උදාහරණ දක්වමින් පරීක්ෂා කරන්න.

07. වර්තමාන සමාජ තත්ත්වය තුළ ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව සඳහා මාර්ගෝපදේශනයෙහි සහ උපදේශනයෙහි සහය වඩාත් අවශ්‍ය බව පෙන්වීමට හේතු පහක් (05) දක්වන්න.

08. සේවාලාභීන්හට ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාවලිය තුළ සහය දැක්වීමට සේවාලාභියා සහ චිකිත්සකවරයා අතර සම්බන්ධතාවයෙහි (Client/therapist relationship)වැදගත්කම අතිශයින් අවධාරණය කරනු ලබන උපදේශනයේ ප්‍රතිකාරාත්මක ප්‍රවේශ දෙකක් (02) සඳහන් කරන්න

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09\. (i) "සමායෝජීබව"(Adjustment) යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 05)

(ii) සමායෝජී වීමට අපොහොසත් වීම අධ්‍යාපනික ගැටලුවක් බවට පත්වන්නේ කෙසේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සමායෝජීබව පිළිබඳ දැනුම උපකාරී පරිසරයක් (Conducive environment) පවත්වාගෙන යැමට ගුරුවරයෙකුට වැදගත්වන ආකාරය දැක්වීමට හේතු තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 09)

10\. (i) එලි ගින්ස්බර්ගේ (Eli Ginzberg) වෘත්තීන් තේරීම පිළිබඳ න්‍යායට අනුව වෘත්තීන් තේරීමේ ප්‍රධාන අවධි තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii) එලි ගින්ස්බර්ගේ වෘත්තීන් තේරීම පිළිබඳ න්‍යායයෙහි එක් එක් අවධියට අදාළ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) වෘත්තීය උපදේශනයේ දී මෙම න්‍යායෙහි ඇති වැදගත්කම පෙන්වීම සඳහා හේතු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

11\. (i) පාසල් පද්ධතියෙන් බැහැරව වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවන් දෙකක් **(02)** නම් කරන්න. (ලකුණු 02)

(ii) අද රටෙහි පවතින උපදේශන අවශ්‍යතාවලට අදාළව ඉහත සඳහන් ඕනෑම මාර්ගෝපදේශන සහ උපදේශන සේවාවක් මගින් ලබාදෙන සේවාවන්හි අදාළත්වය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

(iii) උපදේශනයේ දි සච්චාරිත්‍ර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යැමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08)

12\. (i) මනෝ විශ්ලේෂණාත්මක ප්‍රවේශයෙහි (Psychoanalytic Approach) මූලික දර්ශනය සහ සංදෘෂ්ඨිකවාදී (Existential Approach) ප්‍රවේශයෙහි මූලික දර්ශනය අතර වෙනස දක්වන්න. (ලකුණු 08)

(ii) සංදෘෂ්ඨිකවාදී ප්‍රවේශයෙන් ප්‍රතිලාභ ලබන්නා වූ සේවාලාභීන් වර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) සංදෘෂ්ඨිකවාදී ප්‍රවේශයේ ප්‍රධාන සීමාකම් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

13. "ලෝකයෙහි සමාජීය, සංස්කෘතික සහ ආර්ථික රටාවේ සීඝ්‍ර වෙනස්වීම් ලෝකය තුළ නව ගැටලු නිර්මාණය කර තිබේ. මෙම ගැටලුවලින් සමහරක් තොරතුරු තාක්ෂණයට සම්බන්ධ වේ."

(i) තොරතුරු තාක්ෂණයේ විශාල වෙනස්කම් නිසා ඇතිවන ගැටලු තුනක් **(03)** උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) පාසල් ළමුන් තුළ මනා සමායෝගී පෞරුෂයක් සංවර්ධනය කිරීම කෙරෙහි තොරතුරු තාක්ෂණයට අදාළ ගැටලු බලපාන්නේ කෙසේදැයි පැහැදිළි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත දැක් වූ ගැටලු අවමකර ගනිමින්, මනා සමායෝගී පෞරුෂයක් සංවර්ධනය කර ගැනීමට ගුරුවරුන් ලෙස සිසුන්ට සහය විය හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

14. (i) උපදේශන ක්‍රියාවලිය අතරතුර දත්ත රැස් කිරීම සඳහා භාවිත කළහැකි ශිල්ප ක්‍රම පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) චර්යාමය ගැටලු සහිත ළමයෙකු සතියක කාලයක් සඳහා නිරීක්ෂණය කිරීමට නිරීක්ෂණ ෂෙඩ්‍යුලයක් (Observation Schedule) සකස් කරන්න. (ලකුණු 08)

(iii) ගුරුවරයෙකු ලෙස,ඔබට ඉහත සඳහන් කළ ළමයාට ඉගෙනීම සඳහා උපකාර කළ හැකි ආකාරය දක්වන්න. (ලකුණු 07)

හිමිකම් ඇවිරිණි.